# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2054/3 - 2018 ජනවාරි මස 15 වැනි සඳුදා - 2018.01.15**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ යොමු අංකය: 4/1/*ඉ*/*අත්පත්*/80.
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ යොමු අංකය: 4-3/9/2015/WS/28.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර*:

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 725, නාරම්පොල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ඉඬංගාපොල ගමේ පිහිටි, සර්වේයර් ජෙනරාල් විසින් 2017.12.30 දිනැතිව මැන සහතික කරන ලද, කැඩැස්තර සිතියම් අංක 420214 කලාප අංක 02 න් 01 වැනි කලාපයේ පත්‍ර අංක 5 කරන පිඹුරේ කැබලි අංක 220 වශයෙන් දැක්වෙන ‘‘ කෝන්ගහමුල වත්ත සහ අස්ලියැද්ද‘‘ නැමති ඉඩමෙන් , මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0316 ක් පමණ වන පහත මායිම් තුළ පිහිටි ඉඩම් කොටස.

1. **කැබලි අංක 220 — ඉඩමේ නම - කෝන්ගහමුල වත්ත සහ අස්ලියැද්ද — ප්‍රමාණය - හෙක්ටයාර් 0.0316**

මායිම් :
උතුරට: 187 වැනි බිම් කැබැල්ල; නැගෙනහිරට: 1 වැනි බිම් කැබැල්ල; දකුණට: 189 වැනි බිම් කැබැල්ල; බටහිරට: 219 වැනි බිම් කැබැල්ල

හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය :
1.ක්‍රිස්තෝගු බදූගේ කරුණාරත්න,
අංක 94,
මහ වීදිය,
කන්තලේ.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2018 පෙබරවාරි මස 28 වැනි දින පෙ. ව. 10.00 ට මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2018 පෙබරවාරි මස 21 වැනි දිනට මත්තෙන් එම ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එම ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

ආර්. එම්. පී. රත්නායක,
ප්‍රාදේශීය ලේකම්,
මල්ලවපිටිය.

2018 ජනවාරි මස 12 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
මල්ලවපිටිය.

02 - 03


1A - G 26932 - 22 - (2018/01)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශුද්ධි පත්‍රය

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : ශ්‍රී ජපුර/ඉඅ/12/ආර්ඩී/(03)

2016 නොවැම්බර් මස 11 දිනැති අංක 1992/53 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ඉහත සඳහන් දැන්වීමේ වන්දි පරීක්ෂණ 2016 දෙසැම්බර් මස 14 වැනි දින යනුවෙන් සඳහන් වී ඇතත් එය 2018 ජනවාරි මස 24 වැනි දින වශයෙන් නිවැරදි විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

අමල් ජේ. එස්. එස්. එදිරිසූරිය,
ප්‍රාදේශීය ලේකම්,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

02-04

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.